
නවයුගය

2005 ජනවාරි
49 වසර 05 කලාපය



# ඖෂධ ගැන අපි දැනුවත් වෙමු

" ආරෝග්‍යා පරමා ලාභා" ඒ බුදු වදන යි. එහෙත් කෙතරම් නිරෝගීව සිටින්නට අප කැමති වුව ද, ලෙඩ රෝගවලින් වැළකී සිටින්නට උත්සාහ කළ ද, ලෙඩ රෝග වැළඳේ. ලෙඩ රෝග වැළඳුණු පසු එකම පිහිට වෛද්‍යවරයා ය. කෙතරම් ඉපැරණි කෙතරම් වටිනා ආයුර්වේද වෛද්‍ය ක්‍රමයක් අප සතුව පැවතිය ද අප වැඩි දෙනා ලෙඩ වූ විට යන්නේ බටහිර වෛද්‍යවරයකු වෙත ය. ආණ්ඩුවේ බටහිර රෝහලක් වෙත ය. නැති නම් පෞද්ගලික බටහිර රෝහලක් වෙත ය.

බටහිර වෛද්‍ය ක්‍රමය ඒ තරමට ජනප්‍රිය වීම එක් හේතුවකි. ප්‍රතිකාරවල පහසු බව තවත් හේතුවකි. රෝග නිවාරණය වඩා කඩිනම් වීම තවත් හේතුවකි. තවත් හේතු කිහිපයක්ම ඇත. ඒ කෙසේ වෙතත් බටහිර වෛද්‍ය ක්‍රමය තුළ අපට එක වර නොපෙනෙන, අපට එක වර නොදැනෙන, බොහෝ විට කිසි සේත් නොදැනෙන ජාවාරම්කාර සංස්කෘතියක් ඇත. ඒ ඖෂධ සම්බන්ධයෙනි. ආයුධ ජාවාරම හැරුණු විට ලොව දෙවැනි ලාභදායි ජාවාරම ඖෂධ ජාවාරම බව අද ප්‍රසිද්ධ කරුණකි.

මේ ජාවාරම මර්දනය කිරීම ලෙහෙසි පහසු කටයුත්තක් නොවේ. බහුජාතික බූවල්ලෝ ඒ තරමට ම සෑම අංශයක ම උගේ අඬු විහිද ගෙන සිටින නිසා ය. එහෙත් එය කළ නොහැකි දෙයක් නොවේ. අවශ්‍ය වන්නේ නීතිය දැඩි ලෙස ක්‍රියාත්මක කිරීම සහ මනා පරිපාලනය ය.

අද අපේ වෙළෙඳ පොළේ එක ම ඖෂධය විවිධ වෙළෙඳ නාමවලින් වර්ග සිය ගණනක් ඇත. මිල ගණන්වල පරතරය ද අති විශාල ය. වැඩි ලාභයක් ඇති ඖෂධය විකුණාගන්නට වෙළෙන්ද කැමති ය. තමන්ට වැඩි වරප්‍රසාද හිමි වන ඖෂධය නියම කරන්නට වෛද්‍යවරයා (වැඩි දෙනා) කැමති ය. ගේදොර ඉඩකඩම් විකුණා හෝ ජීවිතය බේරා ගන්නට රෝගියා කැමති ය. ජාවාරම්කාරයාට මල්ල පුරවා ගැනීමට හැකි වී ඇත්තේමේ නිසා ය. අද බොහෝ වෛද්‍යවරු ඉන්නේ ඖෂධ ජාවාරම්කාරයන් ගේ තුරුලේ ය. පිටරට සවාරි, ඔවුන් ගේ දූ පුතුන්ට ශිෂ්‍යත්ව, ඒ ඒ අය ගේ රුචි අරුචිකම් අනුව තවත් බොහෝ දේ ඖෂධ ජාවාරම්කාරයන්ගෙන් වෛද්‍යවරුනට ලැබේ.

ඒ පමණක් නොවේ. රටේ ප්‍රතිපත්ති සම්පාදනය කරන පුද්ගලයන්ට, දේශපාලන බලධාරීන්ට පවා ඖෂධ ජාවාරම්කාරයන්ගේ අනුග්‍රහය ලැබේ. ඒ නිසා රටට හිතකර, ජනතාව ගේ සුබ සිද්ධියට හේතුවන ආකාරයේ ඖෂධ පිළිවෙතක් සකසා ගැනීම සිහිනයක් වී තිබේ. ඒ සඳහා සමහර නීති ඇතත් ක්‍රියාත්මක නොවන්නේ ද ඖෂධ ජාවාරම්කාරයන් ගේ බලය නිසා ය. අලුත් නීති සකස් නොවන්නේ ද ඒ නිසා ය.

මේ සියල්ල ටම වඩා ඖෂධ ජාවාරම්කාරයන්ට, ඇතැම් බොහෝ වෛද්‍යවරුන්ට, ඖෂධ වෙළෙඳ සැල් හිමියන්ට ලෙඩා මළත් බඩ සුද්දයි චිවා සේ රෝගියා සූරා ගෙන කන්නට හැකි වී ඇත්තේ අපේ ජනතාවගේ ඇති නොදැනුවත්කම ය. හොඳම උදාහරණය ශත හිහක් පමණ වන පැරසිටමෝල් පෙත්තකට අප රුපියල් එකයි පනහක් වැය කිරීම ය. වෛද්‍යවරයා නියම කරන ඖධෂය කුමක් ද ? එහි ඖෂධීය නාමය කුමක් ද ? වෛද්‍යවරයා නියම කළ වෙළෙඳ නාමය වෙනුවට ඖෂධීය නාමය සඳහන් කරනවා ද ? ඒ ඖෂධය පාවිච්චියෙන් අතුරු ආබාධ වැළඳීමට ඉඩක් ඇති ද? මේ ආදී ප්‍රශ්න ඇසීමේ අයිතියක් රෝගියා සතු ය. එහෙත් වෛද්‍යවරයාගෙන් එසේ ප්‍රශ්න කරන්නේ රෝගීන් කීයෙන් කී දෙනා ද ? ඒ තත්ත්වයට හේතු වී ඇත්තේ අපේ පෙරදිග සමාජයේ වෛද්‍යවරයා යන පුද්ගලයා ගෞරවනීය, හා අති උතුම් පුද්ගලයෙකි යන සංකල්පය නිසා ය.

එහෙත් සමස්ත සමාජය ය ම, මුළු ලෝකය ම ගෝලීයකරණ ප්‍රවාහය හමුවේ වෙළෙඳ කුණාටුවට හසු වී ගසා ගෙන යන විට වෛද්‍යවරයාට පමණක් ඉන් බේරී සිටීමට නොහැකි ය. ඒ නිසා පවතින තත්ත්වයන් පිළිබඳ නිවැරදි ලෙස දැනුවත් වීමේ වගකීම ඇත්තේ ජනතාව වෙත ය. ජනතාව එසේ දැනුවත් වුව හොත් හිතූ හිතූ ආකාරයට රෝගියා විකුණා ගෙන කන්නට කිසිවෙකුට පහසු නොවේ.

අද බටහිර ඖෂධ ජාවාරමට ඉතා ම සාර්ථක අභියෝගයක් ඉන්දිය ඖෂධ නිෂ්පාදකයන් එල්ල කර ඇත. අපේ රටේ ඖෂධ නිෂ්පාදනය ඒ අතින් ඒ තරම් ඉහළට පැමිණ නැතත් දැනට නිෂ්පාදන කරන ඖෂධ කිහිපය නිසි ආකාරයට පහසු මිලට දෙන්නට ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාවට හැකි වී ඇත. ඒ තත්ත්වය වැඩි දියුණු කිරීම බලධාරීන් ගේ වගකීම ය. මේ කරුණු කාරණා සියල්ල කෙරෙහි අපේ සමාජයේ පවතින අවධානය නම් කිසි සේත් ප්‍රමාණවත් නැත. විශේෂයෙන් අපේ දරු පරපුර මේ පිළිබඳ දැනුවත් විය යුතු ය. දැනුවත් කළ යුතු ය. මෙහි දී විශේෂ වගකීමක් ජනමාධ්‍යකරුවා සතුව ඇත.

ඒ වගකීම වෙනුවෙන් ඇප කැප වුව හොත් අපට මහත් ශක්තියක් වන්නට අපට මඟ පෙන්වන්නට සූදනම් වෛද්‍යවරු ද සිටිති. ඔවුන් සිටින්නේ ඔවුන් ගේ මතය ජනතාව අතර ගෙන යන්නට ක්‍රමවේදයක් නැතිව ය. අප මුල පුරන්නේ නම් ජාවාරමුන්ටත්, උන්ගෙන් යැපෙන උන්ටත් පහසුවෙන් රෝගියා සූරා ගෙන කන්නට හැකි නොවනු ඇත.